**සීමාසහිත සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම - 2016**

---------------------------------------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සීමාසහිත සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය")වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**2.1** **මතය**

**---------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.1** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

**------------------------------------------------------------------------**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**-------------------------**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

**-----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.151,600 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සමාගමේ බදු පූර්ව ශුද්ධ අලාභය රු.2,581,162 ක් වූයෙන් සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල රු.2,429,562 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ විකුණුම් රු.10,662,208 කින් ඉහළ යාම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2** **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-------------------------------------**

**3.2.1** **සමාගමේ ලාභදායීත්වය**

**----------------------------------**

ලංකා බැංකුවට අයත් දේපල සම්බන්ධයෙන් කළමනාකාර නියෝජිතයා වශයෙන් ක්‍රියාකිරීම සමාගමේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව, සමාගම විසින් අවන්හල් 04 ක්, නිවාඩු නිකේතන 07 ක් සහ සේවක නිවාස 23 ක් කළමනාකරණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේ සමාගමේ ලාභදායීත්වය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාගම විසින් 2012 සහ 2013 වර්ෂවලදී බදු පසු ශුද්ධ ලාභයක් උපයාගෙන තිබුණි. 2014 වර්ෂයේ සිට සමාගම බදු පසු ශුද්ධ අලාභයක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී බදු පසු අලාභය සියයට 84 කින් අඩු වී තිබුණි.

(ආ) කාමර වෙන්කිරීමේ ආදායම අඩුවීම හේතුවෙන් පසුගිය වර්ෂයේ රු.මිලියන 0.3 ක් වූ කතරගම සී බැන්ක් අවන්හලේ අලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2.2 ක ප්‍රමාණාත්මක අලාභයක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2012 වර්ෂයේ සිට 2014

දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 1.6 සිට රු.මිලියන 1.2 ක් දක්වා වන පරාසයක ලාභයක් පෙන්නුම් කර තිබුණි.

(ඈ) දික්ඔය, ග්ලේන්කෙයින් (Glencain Bungalow) බංගලාව 2013 වර්ෂයේ සිට අලාභ ලබමින් පවත්වාගෙන ගොස් තිබූ අතර 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අලාභය රු.මිලියන 0.7 ක් දක්වා සියයට 481 කින් වැඩි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී නුවරඑළිය සහ හපුතලේ සීබෑන්ක් නිවාඩු නිකේතන (Ceybank Holiday Homes) විසින් පිළිවෙලින් සියයට 48 ක සහ සියයට 43 ක ශුද්ධ ලාභ අනුපාතයක් පසුගිය වර්ෂයට සාපේක්ෂව පෙන්වා තිබුණි.

(ඉ) ලංකා බැංකු ප්‍රධාන කාර්යාලයේ විධායක නිලධාරීන්ට තේ සැපයීමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.168,309 ක අලාභයක් සමාගම ලබා තිබුණි.

### 3.2.2 සමාගමේ මූල්‍ය තත්ත්වය

සීමාසහිත බීඕසී මැනෙජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පුද්ගලික) සමාගම, සීමාසහිත බීඕසී පොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනෙජ්මන්ට් (පුද්ගලික) සමාගම සීමාසහිත බීඕසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම, මෙම සමාගමේ ප්‍රාථමික කොටස් හිමියන් වන අතර මෙම කොටස් හිමියන් ලංකා බැංකුවේ පූර්ණ හිමිකාරත්වය ඇති පරිපාලිතයන් වේ. එම නිසා සමාගමේ අවසාන මව් සමාගම ලංකා බැංකුව වේ. සමාගමේ පසුගිය වර්ෂ 04 ක සහ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පහත දැක්වේ.

රු.000

| විස්තරය | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | 3,999 | 3,585 | 3,476 | 3,805 | 3,333 |
| මූල්‍ය වත්කම් | 13,263 | 12,062 | 11,322 | 10,292 | 9,183 |
| ජංගම වත්කම් | 11,289 | 12,957 | 10,579 | 12,654 | 10,160 |
| කොටස් ප්‍රාග්ධනය සහ සංචිත | 641 | 1,106 | 4,031 | 4,062 | 3,840 |
| ජංගම නොවන වගකීම් | 12,217 | 11,255 | 7,641 | 7,076 | 6,109 |
| ජංගම බැරකම් | 15,693 | 16,243 | 13,705 | 15,613 | 12,727 |

i සමාගමේ සංචිත 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂ අතර කාලපරිච්ඡේදය තුළ සියයට 83 ක් දක්වා පිරිහී තිබුණි.

ii සමාගමේ ශුද්ධ ජංගම වත්කම්වල සෘණ අගය 2013 වර්ෂයේ සිට අඛණ්ඩව ඉහළ යමින් පැවැති අතර එමගින් සමාගමේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය සතුටුදායක මට්ටමක නොමැති බව අනාවරණය විය.

**3.2.3 වැදගත් ගිණුම්කරණ අනුපාතයන්**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ ඇතැම් වැදගත් ගිණුම්කරණ අනුපාතයන් කිහිපයක් පහත දැක්වේ.

| අනුපාතය | 2016 | 2015 |
|---|---|---|
| **ලාභදායීත්ව අනුපාතය (සියයට)** | % | % |
| ශුද්ධ ලාභ අනුපාතය | (0.32) | (2.19) |
| මුළු වත්කම්වලට ප්‍රතිලාභ | (1.63) | (10.23) |
| ස්කන්ධයට ප්‍රතිලාභ | (72.53) | (264.49) |
| **ද්‍රවශීලතා අනුපාත (වාර ගණන)** | | |
| ද්‍රවශීලතා අනුපාතය | 0.75 | 0.79 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව ලාභදායීත්ව අනුපාතයේ සෘණ අගයන් ධනාත්මක ප්‍රවණතාවයක් පෙන්නුම් කර තිබුණි.

(ආ) 01 ට අඩුවෙන් පැවැති ජංගම අනුපාතය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 5 කින් අඩු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**කාර්යසාධන සමාලෝචනය**

කළමනාකරණ ගාස්තුවක් මත ලංකා බැංකුව සතු දේපල සඳහා කළමනාකාර නියෝජිතයා වශයෙන් සමාගම ක්‍රියා කරනු ලබයි. කෙසේ වුවද, සමාගමේ අරමුණක් ලෙස සාංගමික ව්‍යවස්ථාවලියේ (Memorandum of Article) මෙය ඇතුළත් කර නොතිබුණි.

**5. කළමනාකරණ ක්‍රියාකාරකම්**

කැඩුණු අයිතමයන් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා මාසික සේවා ගාස්තුවෙන් සියයට 10ක වැය නොකළ ශේෂය සේවකයින් අතර බෙදාහැරීමේ නිසි ප්‍රතිපත්තියක් නොමැතිවීම මත සමාගම විසින් රඳවාගෙන තිබුණි. ඒ අනුව, 2016 දෙසැම්බර් 31 දිනට පැවති සමුච්චිත වටිනාකම රු.3,051,738ක් වී තිබුණි.

**6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6.3 විගණනය හා කළමනාකරණ කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාස 03 කට වරක් නිතිපතා පදනමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. එසේ වුවත්, සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 7. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ සමාගමෙහි පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිවරයාට නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාවෙන් අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | - | සමාගම සතුව විධිමත් ජ'නල් සටහන් ක්‍රියාවලියක් නොතිබුණු අතර, ජ'නල් සටහන් ලෙජරයට පිටපත් කිරීම සඳහා ජ'නල් වවුචර්ද නඩත්තු කර නොතිබුණි. |
| | - | ආදායම උත්පාදනය වීමේ නිශ්චිත මොහොතේදී, වෙන්කිරීමේ ආදායම් (Reservation Income) හඳුනාගෙන නොතිබුණි. |
| | - | ගිණුම් අංශය විසින් අවන්හල් මාසික සාරාංශය හා පොදු ලෙජරය අතර මාසික සැසඳීම් සිදුකර නොතිබුණි. |
| (ආ) වත්කම් කළමනාකරණය | - | හඳුනාගැනීමේ අවශ්‍යතාවය සඳහා ස්ථාවර වත්කම් අයිතමයන් ලේබල් කර නොතිබුණි. |
| (ඇ) තොග කළමනාකරණය | - | ඉන්වෙන්ට්‍රි සඳහා ගිණුම්කරණ පද්ධතියක් නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) ණයගැති කළමනාකරණය | - | දිගුකාලීන හිඟහිටි ලැබිය යුතු ගිණුම් සඳහා අඩමාන ණය වෙන්කිරීම තීරණය කිරීමට විධිමත් ලිඛිත කළමනාකරණ ප්‍රතිපත්තියක් නොතිබීම. |